# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1395/15 – 2005 ජුනි 01 වැනි බදාදා – 2005.06.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.–21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ජේදය සමග කියවිය යුතු 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 21 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්–

(අ) විද්‍යාව සහ තාක්ෂණය, පරිගණක විද්‍යාව සහ තාක්ෂණය, කළමනාකරණ විද්‍යා, සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය යන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය සැලසීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා 2005.06.01 වන දින සිට විශ්ව විද්‍යාලයක් පිහිටුවමි ;

(ආ) එම විශ්ව විද්‍යාලයට "ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය" යන නාමය සහ අභිධානය ලබා දෙමි ;

(ඇ) එම විශ්ව විද්‍යාලයේ මූලස්ථානය පිහිටවනු ලැබිය යුතු ස්ථානය බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විය යුතු බවට සඳහන් කරමි ;

(ඈ) තෝරාගත් විෂයයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා කීපයක් විශ්ව විද්‍යාලය විසින් ඇති කළ යුතු බවට නියම කරමි ;

(ඉ) දේශීය සම්පත් පදනම ඇතුළත වටිනාකම් නිර්මාණය කිරීම මත ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබාදීම පිළිබඳව විශ්ව විද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බවට නියම කරමි ; සහ

(ඊ) මෙහි උපලේඛනයේ I වන තීරයේ සහ II වන තීරයේ දක්වා ඇති පීඨ සහ අධ්‍යයන අංශ වලින් එම විශ්ව විද්‍යාලය සමන්විත විය යුතු බව නියම කරමි.

උපලේඛනය

| I වන තීරය<br>පීඨ | II වන තීරය<br>අධ්‍යයන අංශ |
|---|---|
| 1. විද්‍යා හා තාක්ෂණ පීඨය | 1. විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය<br>2. පරිගණක විද්‍යාව සහ තාක්ෂණ අධ්‍යයන අංශය |
| 2. කළමනාකරණ පීඨය | 1. කළමනාකරණ විද්‍යා අධ්‍යයන අංශය<br>2. රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය |
| 3. සත්ත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය | 1. සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය<br>2. අපනයන කෘෂිකර්ම අධ්‍යයන අංශය. |

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06-304

---

එල්.ඩී.බී.–21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ (2) ඡේදය සමග කියවිය යුතු 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම, 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත යටතේ පිහිටුවන ලද ජාතික සමාජ සංවර්ධන ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, සමාජ කටයුතු පිළිබඳ උපාධිය පිරිනැමීමට ඉඩකඩ සලස්වාලමින් උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් ඉහත කී ආයතනය මේ නියමයෙන් පිළිගනිමි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06-305

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.